**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භෞතික වත්කම් විකිණීමෙන් ලද රු.86,850 ක් වූ මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ භෞතික වත්කම් විකිණීමෙන් ලද ආදායම ලෙස දැක්විය යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායමට ඇතුළත් කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සතුව ආදායම් ගිණුමක් නොමැති බැවින් භාණ්ඩ අපහරණය කිරීමෙන් ලද මුදල් අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ වාර්තාකර ඇති බව දන්වා තිබුණි. | නිවැරදි ආකාරයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කළ යුතු ය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළදී අපහරණය කරන ලද භාණ්ඩවල ගත් මිල ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබූ අතර, එම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දේපල, පිරියත හා උපකරණවල වටිනාකම හා එහි සංචිත වටිනාකමෙහි නිවැරදි | මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන/ පළාත් සහ ප්‍රාදේශීය කාර්යාලවල පවතින ස්ථාවර වත්කම් සියල්ල CIGAS වැඩසටහනට ඇතුළත්ව නොමැති අතර, 2023 වර්ෂයේදී අපහරණය කරන ලද කිසිදු ස්ථාවර වත්කමක් CIGAS වැඩසටහන තුළ නොමැති බැවින් එම භාණ්ඩ ඉවත්කිරීමක් සිදුකර නොමැති | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | අගය පෙන්නුම් නොකෙරුණි. | අතර, මේ වන විට සියලුම වත්කම් ක්‍රමානුකූලව CIGAS වැඩසටහනට ඇතුළත් කිරීම සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA-6) මිලදී ගැනුම් සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 80 වාර්තා අනුව වර්ෂයේ මිලදී ගැනීම්වල එකතුව අතර රු.9,200,863 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, එම වෙනසට හේතුව මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මඟින් දක්වා නොතිබුණි. | තවදුරටත් මෙවැනි දෝෂ ඇති නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (iii) | දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාලවල පවතින ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර, CIGAS පද්ධතියට ඇතුළත්කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම සහ එහි සංචිත වටිනාකමෙහි නිවැරදි අගය නිරීක්ෂණය නොවී ය. | මෙම දෙපාර්තමේන්තුවේ CIGAS වැඩසටහනට ඇතුළත් නොවන සියලුම ස්ථාවර වත්කම් මේ වන විට වැඩසටහනට ඇතුළත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය පිළියෙල කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව තුළ දේශීය ගමන් වියදම් සහ ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා පිළිවෙලින් රු.18,000,000 ක සහ රු.3,000,000 ක ප්‍රතිපාදනවලට අතිරේකව පරිපූරක අයවැය ඇස්තමේන්තුව යටතේ පිළිවෙලින් රු.7,500,000 ක් සහ රු.850,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබූ නමුත්, වර්ෂ අවසානයට පිළිවෙලින් රු.8,505,447 ක් හා රු.1,002,287 ක් එනම් පරිපූරක අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 113 ක සහ සියයට 118 ක ප්‍රතිශතයක් ලබාදී තිබූ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | 2023 වර්ෂයේ ගමන් වියදම් සඳහා ඇස්තමේන්තු කළ සියලුම නිලධාරීන් ඉල්ලුම් නොකිරීමත් ඔක්තෝබර් හා නොවැම්බර් මාස සඳහා ගමන් වියදම් වවුචර්වලින් බොහොමයක් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් නොකිරීමත්, ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ ලබාගත් ප්‍රතිපාදන ප්‍රමාණය හම්බන්තොට ප්‍රජා විශෝධන කාර්යාලයේ වහල අලුත්වැඩියා කිරීම සඳහා තංගල්ල මහාධිකරණය වෙත පවරාදුන් නමුත්, ඒ සඳහා ලංසු කැඳවීම්කර තිබුණ ද, කිසිදු ආයතනයකින් මිල ගණන් ඉදිරිපත් නොකිරීම නිසා වර්ෂය තුළ එම ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වූ නිසා ඉතිරිවීම් සිදු වූ බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙනත් දීමනා සහ ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා වැය විෂයයන් සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනවලට අතිරේකව මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් යටතේ පිළිවෙලින් රු.3,000,000 ක සහ රු.1,500,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණ ද, වර්ෂ අවසානයට පිළිවෙලින් රු.1,759,144 ක් සහ රු.420,059 ක මුදලක්, එනම් මාරුකිරීම් වලින් පිළිවෙලින් සියයට 59 ක් හා සියයට 28 ක් ඉතිරි වී තිබුණි. | ලිපිද්‍රව්‍ය සඳහා අමතර ප්‍රතිපාදන ලබාගත්ත ද, වර්ෂය අවසානයේදී අක්මුදල් ලබාදීම අඩුවීම නිසා මිලදී ගැනීම් සිදු නොකරන ලද අතර, ඒ අනුව 1201 වැය විෂයයෙහි මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වූ බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ චක්‍රලේඛයෙහි 03(xvii) වගන්තිය අනුව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම්, ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 5 ක රු.6,260,000 ක් වූ ප්‍රතිපාදන සහ මූලධන වැය විෂයයක රු.1,000,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. | වැය විෂයයන් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත්, ප්‍රතිපාදන ප්‍රමාණය ඒ අයුරින්ම නොලැබීමත්, 2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන්කර නොමැතිවීමත්, රාජකාරී කටයුතු විධිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතු සීමිත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් නිසා මෙසේ වැය විෂයයන් අතර මාරු කළ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ හා බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ රු.212,835 ක බැරකම් 2024 වර්ෂයේදී නිරවුල්කර තිබුණි. | පළාත් සහ ප්‍රාදේශීය කාර්යාල 115 ක් පමණ පවතින අතර, එම කාර්යාලවලින් ගෙවීම් කිරීමට ලැබෙන ඇතැම් බිල්පත් මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පවතින කාලසීමාවේ නොලැබීම මත බැරකම් ලේඛනයේ හා බැරකම් ප්‍රකාශනයේ ඇතුළත් කිරීමට නොහැකිවී ඇති අතර, මෙය සර්ව සම්පූර්ණයෙන්ම සිදුකිරීම ප්‍රායෝගිකව අපහසු වේ. එබැවින් මින් ඉදිරියට මෙවැනි අවස්ථාවන් අවම කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාළ බැඳීම් හා බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහ එම අධීක්ෂණ කටයුතු ගණකාධිකාරී විසින් සිදුකරගෙන යනු ලබන අතර, මේ වන විට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති නමුත්, පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව සමාලෝචන රැස්වීම් පවත්වා නොමැති බැවින්, එම සමාලෝචන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකිවී ඇති අතර, ඉදිරියේදී මීට අදාළ ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම් අවම නිලධාරීන් ප්‍රමාණයක් යටතේ හෝ පවත්වා සමාලෝචනයන් සිදුකර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීමට ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | 447 (1) | - | පොදු 138 වැය ලෙජරයෙහි බැඳී ඇති බැරකම් පිළිබඳව දක්වා නොතිබුණි. | මින් ඉදිරියට මෙවැනි අවස්ථා නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | 447 (4) හා (5) | - | සියලු බැරකම් ඒවා සිදු වූ විගස ගිණුමේ වම් පැත්තේ සටහන් කළ යුතු වුව ද, බැරකම් සම්බන්ධයෙන් එසේ කටයුතුකර නොතිබුණි. | මින් ඉදිරියට මෙවැනි අවස්ථා නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | | | |
| | 2010 ජූලි මස 09 දිනැති අංක CA/1/1/16/1 දරන චක්‍රලේඛය හා 1993 දෙසැම්බර් 31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන චක්‍රලේඛය | | නිලධාරීන් හතරදෙනෙකු විසින් චක්‍රලේඛය පරිදි විදේශ සංචාර සඳහා අදාළ වාර්තාවන් ඉදිරිපත්කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය පරිදි අදාළ නිලධාරින් දැනුවත් කරන අතර, වාර්තාවන් ලබාදුන් වහාම අදාළ බලධාරියා වෙත එම වාර්තා ලබාදීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (iii) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ (i) ඡේදය | ආයතනයේ සේවය නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරින්, ප්‍රජා විශෝධන නිලධාරි සඳහා ගිවිසුම් යොමුකර ඇති අතර, මේ වන විට නැවත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(1) අනුව කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ ය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ 6.i ඡේදය | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුව ද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්ම අනුව වාර්ෂික පුහුණු සැලැස්මක් සකස්කර නොමැති වුවත්, සකස් කර ඇති වාර්ෂික පුහුණු සැලැස්මට සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි සකස්කර තිබුණ ද, ප්‍රතිපාදන ගැටලු මත පුහුණුවීම් ලබාදිය නොහැකි වූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (iv) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | ඉදිරි වර්ෂයේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, 2023 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්රාග්ධන වැඩසටහන් පමණක් ඇතුළත්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් 2022 දෙසැම්බර් 30 දින අනුමතකර තිබුණි. | ඉදිරි වර්ෂයේ පුනරාවර්ථන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි අතර, ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර 2022 දෙසැම්බර් 20 දින අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත අනුමැතිය සඳහා යොමුකර ඇති අතර, මෙම වර්ෂයේ සිට අදාළ පරිදි කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**(v) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ**

| | | | | |
|---|---|---|---|---|
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන මාර්ගෝපදේශයේ 06 ඡේදය | - | මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්තාකරන ආයතනයේ වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුව ද, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය, පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය සහ අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන තුළ හිස් වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. | මින් ඉදිරියට මෙවැනි අවස්ථා නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන මාර්ගෝපදේශයේ 8.3 ඡේදය | - | සියලුම වාර්තාකරණ ආයතන විසින් තැන්පතු සඳහා සැසඳීම් ප්‍රකාශය පිළියෙලකර 2024 පෙබරවාරි 28 වැනි දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි. | මින් ඉදිරියට මෙවැනි අවස්ථා නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව, කිසියම් විශේෂිත කාර්යයක් සඳහා තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම තත්කාර්ය අතුරු | මෙවැනි තත්ත්වයන් මින් ඉදිරියට සිදු නොවීමට අවශ්‍ය පියවරගනු ලබන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | අග්‍රිමය පියවිය යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අවස්ථා 07 කදී ලබාගත් අතුරු අග්‍රිම පියවීමට දින 16 සිට දින 86 දක්වා කාලපරාසයක් ප්‍රමාදකර තිබුණි. | | |
| (ආ) | අත්තිකාරම් ලබාදීමේදී අදාළ කාර්යය නිසි ලෙස ඇගයීමට ලක් නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේදී ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිමවලින් නැවත පියවීමේ ප්‍රතිශතය සියයට 36 සිට සියයට 54 දක්වා පරාසයක් ගෙන තිබුණි. | අදාළ කාර්යයේදී ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණයම වැය නොවීමත්, අත්‍යාවශ්‍ය වියදම් පමණක් දැරීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා අපේක්ෂිත නිලධාරින් සංඛ්‍යාවක් සහභාගී නොවීමත් නිසා අග්‍රිම ඉතිරි වූ බව දන්වා තිබුණි. | අදාළ කාර්යය නිසි ලෙස ඇගයීමට ලක්කිරීමෙන් පසු අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව, අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 වැනි දින හෝ ඊට පෙර නැවත පියවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් ශාඛාවන් 6 කට අදාළව රු.24,840 ක් වටිනා සුළු මුදල් 2024 පෙබරවාරි 15 දින පියවා තිබුණි. | පළාත් හා ප්‍රාදේශීය කාර්යාල සියයකට වඩා පවතින බැවින්, ගිණුම් කටයුතු සිදු කිරීමේදී ඇතිවන ගැටලු මඟහරවා ගැනීම සඳහා අදාළ වර්ෂයේ ජනවාරි 01 සිට නොවැම්බර් 30 දක්වා වවුචරපත් දෙසැම්බර් 05 වන විට එවන ලෙසත් දෙසැම්බර් මස බිල්පත් ඉදිරි වසරේ ජනවාරි මස තුළදී ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරන ලෙස දැනුවත්කර ඇති නමුත් ප්‍රාදේශීය කාර්යාලවල සිටින නිලධාරීන්ගේ 2024 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු 2024.02.01 දින සිට ක්‍රියාත්මක වූ බැවින් අදාළ කාර්යාල සඳහා සුළු අක්මුදල් ලබාදීම හා සුළු මුදල් ප්‍රතිපූරණය පෙබරවාරි මස තුළදී සිදුකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම තුළ අම්පාර ප්‍රජා විශෝධන කාර්යාලය අලුත්වැඩියා කිරීම සඳහා රු.900,000 ක් ඇස්තමේන්තුකර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ මෙම ක්‍රියාකාරකම සිදුකර නොතිබුණි. | අම්පාර ප්‍රජා විශෝධන කාර්යාලයේ අලුත්වැඩියාව සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර තිබුණ ද, උඩුගම සහ කැබිතිගොල්ලෑව යන ප්‍රජා විශෝධන කාර්යාල 02 හි අලුත්වැඩියාවන් ප්‍රමුඛ සහ හදිසි අවශ්‍යතාවයන් වූ බැවින් එම ප්‍රතිපාදන ප්‍රමාණය ලබාදී තිබූ බව දන්වන ලදී. | සැලසුම් කරන ලද කාර්යයන් සඳහා මූලිකත්වය ලබාදෙමින් කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ඇඟිලි සලකුණු යන්ත්‍රයක්, ප්‍රධාන කාර්යාලය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට රු.1,980,000 ක් වැය කිරීමට සැලසුම් කළ ද, එම කාර්යයන් සිදුකර නොතිබුණි. | පළාත්/ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල සඳහා අත්‍යාවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා 2023 වර්ෂයෙහි අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කර ඇති රු.1,000,000 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා, 2103 වැය විෂයය යටතේ මිලදී ගැනීමට සැලසුම් කළ ප්‍රතිපාදන වූ රු.මි.1.9 ක ගෘහභාණ්ඩ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සිදුකළ බවත් දන්වා තිබුණි. | සැලසුම් කරන ලද කාර්යයන් සඳහා මූලිකත්වය ලබා දෙමින් කටයුතු කළ යුතු ය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා වන නෛතික හා අධිකරණමය කරුණු සොයා බැලීමට පත්කළ කාර්යසාධන බලකාය විසින් ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය මූලික විකල්පයක් ලෙස හඳුනාගෙන ඇති | ප්‍රාදේශීය කාර්යාල කිහිපයක් සඳහා ඉඩපහසුකම් සහ අනෙකුත් පහසුකම් ලබාදෙන ලෙස අධිකරණ අමාත්‍යාංශය දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ නිරත නිලධාරීන්ට තම කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉඩපහසුකම් හා කාර්යාලීය පහසුකම් |

| | | | |
|---|---|---|---|
| | අතර, පළාත් 9 කට අදාළව මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා තිබෙන ප්‍රජා විශෝධන කාර්යාල 49 ක ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිවීම නිසා ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් අංක DCBC/EST/04 හා 2022 අප්‍රේල් 04 දිනැති ප්‍රජා විශෝධන කොමසාරිස්වරයාගේ ලිපිය මගින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට යොමුකර තිබුණ ද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවරගෙන නොතිබුණි. | | ප්‍රමාණවත් පරිදි ලබාදිය යුතු ය. |
| (ආ) | ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ ප්‍රගතිය මැන බැලීම සඳහා ක්ෂේත්‍ර අධීක්ෂණ 15 ක් සිදු කිරීමට වර්ෂය තුළ සැලැසුම් කළ ද, ක්ෂේත්‍ර අධීක්ෂණ 07 ක් එනම් සියයට 47 ක් පමණක් වර්ෂය තුළ සිදුකර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු හේතුවෙන් සමස්ත කටයුතු කොමසාරිස් විසින්ම සිදුකළ යුතු බැවින්, පවතින කාර්ය බහුලත්වය හා පනවන ලද සීමා මත කොමසාරිස්ගේ ප්‍රධානත්වයෙන් ක්ෂේත්‍ර අධීක්ෂණ 07 ක් පමණක් සිදුකළ බව දන්වා තිබුණි. | සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම සඳහා වර්ෂය තුළදී පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමට වැඩසටහන් 105 ක් පමණ සැලසුම්කර තිබුණ ද, වර්ෂය තුළදී වැඩ සටහන් 54 ක් පමණක් එනම් සියයට 51ක් පමණ නිමකර තිබුණි. | සෑම ප්‍රාදේශීය කාර්යාලයක් මඟින්ම එක් වැඩසටහන් සිදු කිරීම සඳහා සැලසුම්කර වැඩසටහන් 105 ක් ඉලක්ක කර තිබුණ ද, තම අධිකරණ බලප්‍රදේශයට අයත් පොලිස් ස්ථානවල පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා අදාළ නිලධාරීන් සම්බන්ධ කරගැනීම අපහසු වූ බැවින් අපේක්ෂිත ඉලක්කය ළඟාකර ගැනීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. |

### 3.3 මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ 2010 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් රු.1,009,934 ක මුදල් වියදම් කර තිබුණ ද, ඉදිකිරීම් කටයුතු අවසන් වී නොතිබුණි. | 2010 වර්ෂයේ මෙම ගොඩනැඟිල්ලට අදාළව ප්‍රසම්පාදන කටයුතු, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ ගෙවීම් කටයුතු සියල්ල අධිකරණ අමාත්‍යාංශය විසින් සිදුකර ඇති අතර, අතරමග නවතා ඇති කොටස නැවත කඩිනමින් සකස්කර ලබාදෙන ලෙස ලිඛිතව අමාත්‍යාංශය දැනුවත් කළ ද, මේවන තෙක් පිළිතුරු ලැබී නොමැති නිසා නැවත වරක් මේ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 7 ඡේදය ප්‍රකාරව එක් එක් ආයතනය විසින් මිලදීගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.13,830 ක් වටිනා විදුලි උපාංග පිළිබඳව හා සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර නොතිබුණි. | මෙම විදුලි උපාංගය 2023 මැයි මාසයේ මිලදී ගෙන ඇති අතර, මේ පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත 04 වන කාර්තුවේ අවසානයේදී ඉදිරිපත් කළ ඇති අතර, තවදුරටත් මෙවැනි අතපසුවීම් සිදු නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 880 රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන්කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත්කර නොතිබුණි. | මීට අදාළ ආකෘති සහ ලේඛන අධිකරණ අමාත්‍යාංශයේ ඇප සම්බන්ධ අංශයෙන් මේ වන විට ලබාගෙන ඇති අතර, ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ගේ විස්තර සහ ආකෘති සම්පූර්ණකර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි | චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුත්තලම අධිකරණ පරිශ්‍රයේ කාමරයක් තුළ පවත්වාගෙන ගිය ප්‍රජා විශෝධන කාර්යාලයේ 2022 ජුනි 31 දින ඇති වූ හදිසි ගින්නකින් එම කාර්යාලයේ තිබූ, පිරිවැය රු.163,302 ක් වූ කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබූ අතර, ඒ පිළිබඳව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන්කර නොතිබුණි. | මෙහි සඳහන් කාර්යාල උපකරණ වර්ග 06 පොත්වලින් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද නමුත්, පුත්තලම කාර්යාලය ගිනි ගැනීමට අදාළ නඩුවේ තීරණය ලැබෙන තෙක් තීරණයක් ලබාදිය නොහැකි බවට අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබූ බැවින්, ඒ පිළිබඳව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් නොකරන ලද බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල ආවරණය වන පරිදි 2018 වර්ෂයේ රු.2,889,145 ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍ර 97 ක් ස්ථාපිතකර තිබුණු අතර, ප්‍රාදේශීය කාර්යාල බොහෝමයක අඩු පහසුකම් සහිතව කුඩා කාමරවල පවත්වාගෙන යන කාර්යාලවල තාවකාලික විදුලි පරිපථ සකස්කර මෙම යන්ත්‍ර සවිකර තිබුණි. ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සියලු ප්‍රාදේශීය කාර්යාලවල තොරතුරු ලබාගැනීමේ දත්ත පද්ධතිය සමාලෝචිත වර්ෂය තුළදී ද, වැඩි දියුණුකර නොතිබීම තුළ ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාලවල සවිකර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර ප්‍රධාන කාර්යාලය හා මධ්‍යගත කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර, ඇඟිලි සලකුණු යන්ත්‍ර 96 න් යන්ත්‍ර 84 ක් පමණ මේ වනවිට මධ්‍යගතකර ඇති අතර, එහි පිටපත් ජොෂ්ඨ ප්‍රජා විශෝධන කාර්යාලවලට ප්‍රධාන කාර්යාලය මඟින් යොමු කරනු ලබන බව දන්වා තිබුණි. | ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය ඉදිකිරීම ප්‍රමාදවීම නිසා ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ නියැලී සිටින නිලධාරීන්ට, ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශනයට ලක්කිරීම හා අනෙකුත් කාර්යාල කටයුතු විවිධ දුෂ්කරතා යටතේ අධිකරණ පරිශ්‍රයේ පිහිටි අඩි 11 x 11 වර්ග ප්‍රමාණයකින් යුත් කුඩා කාමරයක පවත්වාගෙන ගොස් තිබුණු අතර, 2022 ජුනි 21 දින ඇති වූ ගින්නකින් කාර්යාලයේ පැවති පරිගණක යන්ත්‍රය, ඡායා පිටපත් යන්ත්‍රය, ඇඟිලි සළකුණු යන්ත්‍රය හා අනෙකුත් කාර්යාල උපකරණ | කාර්යාලය ගිනිගැනීමට අදාළව මූලික පරීක්ෂණ වාර්තාවක් සහ මෙහි සඳහන් කාර්යාල උපකරණ වර්ග 06 පොත්වලින් කපා හැරීම සඳහා නැවත පූර්ණ විමර්ශනයක් සිදුකර එම වාර්තාව ද සමඟ විනාශ වූ භාණ්ඩ පොත්වලින් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකළ ද, පුත්තලම කාර්යාලය ගිනි ගැනීමට අදාළව නඩුවක් පවතින බැවින් එම නඩුවේ තීරණය ලැබෙන තෙක් තීරණයක් ලබාදිය නොහැකි බවට අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා තිබුණි. | විමර්ශන කටයුතු ආරම්භ කර වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කර නොතිබුණි. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින්, විනාශ වූ ස්ථානය වෙනුවට වෙනත් තාවකාලික ස්ථානයක් සොයා ගැනීමට හෝ අඩක් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කරගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතුකර නොතිබුණි. | දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ යෝජනා සහ තීරණය අනුව පුත්තලම ප්‍රජා විශෝධන කාර්යාලය ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙස අධිකරණ අමාත්‍යාංශය දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | ස්ථානයක් සොයා ගැනීම හෝ ඉදිකිරීම් කටයුතු අවසන්කර ගැනීම කඩිනම් කළ යුතු ය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී තිරසර සංවර්ධන අරමුණක් හඳුනාගෙන එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ප්‍රධාන ඉලක්ක තුනක් පිළියෙලකර තිබුණි. ඉන් ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමුකරන පුද්ගලයින්ගෙන් සියයට 40 ක ප්‍රමාණයක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත්කිරීමට ඉලක්කකර තිබුණ ද, එහි ප්‍රගතිය සියයට 45 ක මට්ටමක පැවතුණු අතර, මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම තුළින් ඉන් සියයට 35 ත් 40 ත් අතර ප්‍රමාණයක් මුදවා ගැනීමට ඉලක්ක කළ ද, එය සියයට 40 ක මට්ටමක පැවතිණි. එසේම ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන පුද්ගලයින්ගේ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සාමාජීය, ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් නඟා සිටුවීම අරමුණුකර තිබුණ ද, එම අරමුණු කරා ළඟාවීමේ ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු යටතේ හඳුනාගත් ඉලක්කවලින් 03 වැනි ඉලක්කය හඳුනාගෙන ඇතත්, ජයග්‍රහණ දර්ශක හඳුනාගෙන නැති නමුත්, 2024 වර්ෂයේ සිට මේ සඳහා ජයග්‍රහණ දර්ශක හඳුනාගෙන ඇති අතර, එහි ප්‍රගතිය 2024 කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීමට කටයුතු කළ යුතු ය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු දෙපාර්තමේන්තුවේ නොමැති බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතු ය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඵලදායි සේවා මට්ටමක් පවත්වාගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳව කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 03 ක් ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 20 ක් ද, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 26 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 6 ක් ද වශයෙන් දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු 55 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි තනතුරට පත්වීම සඳහා බඳවාගැනීමේ පටිපාටිය අනුව ප්‍රජා විශෝධන නිලධාරී තනතුරෙහි 1 ශ්‍රේණියේ වසර පහක සේවා කාලයක් තිබුණ ද, වසර පහක කාලසීමාව තුළ වැටුප් වර්ධක උපයාගෙන නොමැති වීම හේතුවෙන් පත්වීම් ලබාදිය හැකි ද යන්න පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා ඇති අතර, සහකාර/නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 03 න් එකක් සඳහා බඳවාගෙන ඇති අතර, අනෙක් තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරන ලද නිලධාරීන් මේ වන විටත් නොමැති අතර, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා අදාළ තනතුරුවලට බඳවාගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | තනතුර, අභ්‍යන්තර විගණක තනතුර සහ භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ලිඛිතව හා misco පද්ධතිය හරහා ඉල්ලීම් සිදුකර ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ පාලන මෙහෙයුම් ධූරාවලියේ ප්‍රධාන පරිපාලන තනතුර වන ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී තනතුරු 10 ක් සඳහා අනුමැතිය ලැබී තිබුණ ද, 2010 වර්ෂයේ සිට මෙම තනතුරු පුරප්පාඩුව පවතින අතර, එම නිත්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් පරිපාටින්ට අනුව උසස් කිරීමෙන් හෝ බඳවාගැනීමෙන් තොරව රාජකාරි ආවරණය කිරීමට ප්‍රජා විශෝධන නිලධාරීන් පත්කර තිබුණි. | ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි තනතුරට පත්වීම සඳහා බඳවාගැනීමේ පටිපාටිය අනුව ප්‍රජා විශෝධන නිලධාරී තනතුරෙහි 1 ශ්‍රේණියේ වසර පහක සේවා කාලයක් අවශ්‍ය වන අතර, දැනට සිටින නිලධාරීන් එම සුදුසුකම 2022 වර්ෂයේ සපුරා තිබුණ ද, වසර පහක කාලසීමාව තුළ වැටුප් වර්ධක උපයාගෙන නොමැති වීම හේතුවෙන් පත්වීම් ලබාදිය හැකි ද යන්න පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා ඇති බැවින් මෙම තනතුරු 10 සඳහා පත්කිරීම ප්‍රමාද වී ඇති බව දන්වා තිබුණි. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා අදාළ තනතුරුවලට බඳවාගැනීමට කටයුතු කළ යුතු ය. |